# සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය

# සබරගමුව පළාත් සභාව

**සබරගමුව පළාත් පරිවාස, ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන සේවා ගණයට (PL 1 – 2016) අයත් ළමා සංවර්ධන සහකාර III වන ශ්‍රේණියට බඳවා ගැනීම - 2024**

සබරගමුව පළාත් පරිවාස, ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන සේවා ගණයට (PL 1 - 2016 ) අයත් ළමා සංවර්ධන සහකාර III වන ශ්‍රේණියේ තනතුරට විවෘත පදනමින් බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. පුරප්පාඩු සංඛ්‍යාව - 03

02. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය :2024.08.30

03. බඳවා ගැනීමේ සුදුසුකම්:-

**ආ) අධ්‍යාපන සුදුසුකම් :**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙක (02) ක් සහිතව විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.

**ආ). පළපුරුද්ද :**

රජයේ හෝ අර්ධ රාජ්‍ය, විශේෂ අවශ්‍යතා සහිත දරුවන් රැකබලා ගැනීම, ඔවුන්ගේ සංවර්ධනය උදෙසා වැඩසටහන් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම සම්බන්ධ අවම වශයෙන් වසරකට නොඅඩු පළපුරුද්ද

04. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

05. තනතුරට හිමි වැටුප් පරිමාණය:

අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව ළමා සංවර්ධන සහකාර III වැනි ශ්‍රේණියට අදාළ වැටුප් කාණ්ඩය PL1-2016 වන අතර අදාළ මාසික වැටුප් පරිමාණය රු. 24,250-10x250- 10x270- 10x300- 12x330- රු.36,410/- වේ.

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ලකුණුවල ප්‍රමුඛතාව මත ඉහළම කුසලතාවය දක්වන අයදුම්කරුවන් කුසලතා අනුපිළිවෙලට පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන ප්‍රමාණයක් රා.පරි.චක්‍රලේඛ 15/90 විධි විධාන පරිදි දිස්ත්‍රික් ජන අනුපාතය අනුව බඳවා ගනු ලැබේ.

07. මෙම බඳවා ගැනීමට අදාළ සම්පූර්ණ නිවේදනය සහ ආදර්ශ අයදුම්පත්‍රය **www.sg.gov.lk** වෙබ් අඩවියේ පළ කර ඇත.

**දිනීෂා එස්. රත්නායක**
**ලේකම්, සමාජ සුබසාධන පරිවාස හා ළමාරක්ෂක**
**ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය,**
**සබරගමුව පළාත් සභාව.**
**2024.07.11**